# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2399/16 - 2024 අගෝස්තු මස 26 වැනි සඳුදා - 2024.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය මගින් මා වෙත පවරන ලද බලතල ප්‍රකාර සහ 2024 මාර්තු 28 දිනැති අංක 2377/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පැහැදිලි කරන ලද 2021 ජූලි 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම නිවේදනය මගින්;

(1) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මින් මතු "මණ්ඩලය" ලෙස හැඳින්වෙන) ට අයත් මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්හි පිහිටි විශේෂිත රෙදිපිළි නිෂ්පාදන කලාපය (මින් මතු "කලාපය" ලෙස හැඳින්වෙන) තුළ පිහිටා ඇති, 2022 ජූනි 24 දින මණ්ඩලය සමඟ ගිවිසුමක (මින් මතු "BOI ගිවිසුම" ලෙස හැඳින්වෙන) ට එළඹ, 2024 ජූලි 25 දිනැති අතිරේක ගිවිසුමකින් සංශෝධනය කර ඇති "ජේ ජේ ටෙක්ස්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" (PV 00246395) (මින් මතු "ව්‍යවසාය" ලෙස හඳුන්වනු ලබන) යනු 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ 2021 ජූලි 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් හඳුනාගෙන ප්‍රකාශයට පත්කර ඇති, 2024 මාර්තු 28 දිනැති අංක 2377/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පැහැදිලි කර ඇති ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියේ විෂය පථය තුළට ගැනෙන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත් කරමි.

(2) ව්‍යවසාය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව ආරම්භ කිරීම සඳහා බලපැවැත්වෙන දිනය 2024 ජූලි 25 දින වන අතර ව්‍යවසායයේ බදු නිදහස් කාල සීමාව 2024 ජූලි 25 දින සිට මාස දොළහක් (12) ගතවීමෙන් අනතුරුව ගණන් බැලිය යුතුය.

(3) 2024 මාර්තු 28 දිනැති අංක 2377/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පැහැදිලි කර ඇති පරිදි, ව්‍යවසායයේ විස්තර 2021 ජූලි 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* II වන උපලේඛනයේ 1 වගුවට සහ 2 වගුවට ඇතුළත් කළ යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වගුව 1 : ''කලාපය'' තුළ පිහිටුවා ඇති ව්‍යවසායන් පිළිබඳ විස්තර

| *අනු. අංකය* | *ගැසට් නිවේදනයේ අංකය සහ දිනය* | *ව්‍යවසායේ නම* | ***BOI*** *සමග ගිවිසුම්ගත දිනය* | *ව්‍යාපෘතියේ ස්වභාවය* | *සුදුසුකම් ලැබීමේ නිර්ණායක* | *ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව* | *ව්‍යාපෘතිය වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය* |
|---|---|---|---|---|---|---|---|
| 1 | අංක 2399/16 2024 අගෝස්තු 26 දින | ජේ ජේ ටෙක්ස්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 00246395) | 2024 ජූලි 25 දිනැති අතුරු ගිවිසුම මගින් සංශෝධිත 2022 ජුනි 24 දින | වක්‍ර අපනයනයන්ද ඇතුළත් අපනයනයන් සඳහා සහ දේශීය අලෙවි කටයුතු හරහා ආනයන ආදේශනය සඳහා රෙදිපිළි නිෂ්පාදනය සහ සැකසුම | ව්‍යාපාරය විසින් :<br>(i) BOI ගිවිසුමේ දින සිට මාස හැටක (60) කාල පරිච්ඡේදයක් ඇතුළත එක්සත් ජනපද ඩොලර් මිලියන තිස් පහකට (එ.ජ.ඩො. 35,000,000/-) නොඅඩු මුදලක් හෝ එම මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් හෝ ආයෝජනය කළ යුතු ය;<br>(ii) BOI ගිවිසුමේ දින සිට මාස හැටක (60) කාල පරිච්ඡේදයක් ඇතුළත දේශීය රැකියා අවස්ථා හාරසිය අනූවක් (490) සම්පාදනය කළ යුතු ය;<br>(iii) දේශීය බැංකු සහ/හෝ සංවර්ධන මූල්‍ය ආයතන ද ඇතුළත් යම් දේශීය මූලාශ්‍රයකට ආපසු යොමු වීමකින් හෝ බැඳීමකින් තොරව විදේශ මූලාශ්‍රයන්ගෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත එක්සත් ජනපද ඩොලර් මිලියන තිස් පහක (එ.ජ.ඩො. 35,000,000/-) සෘජු විදේශ ආයෝජනය සඳහා මූල්‍ය සම්පාදනය සිදු කළ යුතු ය; සහ<br>(iv) එක්සත් ජනපද ඩොලර් අට මිලියන හත් ලක්ෂ පනස් දහසක (එ.ජ.ඩො. 8,750,000/-) කොටස් ප්‍රාග්ධනය ජේ ජේ මිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්හි රඳවාගත් ඉපැයීම් තුළින් ලබාගත යුතු ය. | 2024 ජූලි මස 25 දින සිට මාස පනස් හතරක් (54) | **අදියර 1** (ග්‍රීජ් රෙදි සායම් කිරීම සහ නිම කිරීම) - 2024 ජූලි මස 25 දින සිට මාස දහ අටක් (18)<br>**අදියර 2** (ග්‍රීජ් රෙදි සායම් කිරීම සහ නිම කිරීම හා ගෙතුම් කටයුතු) - 2024 ජූලි මස 25 දින සිට මාස හතලිස් දෙකක් (42)<br>**අදියර 3** (ගෙතුම් මෙහෙයුම්වල ධාරිතාව වැඩි දියුණු කිරීම) - 2024 ජූලි මස 25 දින සිට මාස පනස් හතරක් (54) |

**වගුව 2** : ඉහත 1 වන වගුව තුළ හඳුනාගනු ලැබූ ව්‍යවසායන් සඳහා ලබා දී ඇති දිරිගැන්වීම් පිළිබඳ විස්තර

| අනු අංකය | ව්‍යවසායයේ නම | බදු නිදහස් කාල සීමාව[1] | | | | | | සේවා නියුක්තිය මත ආදායම් බදු නිදහස්-කරණය[2] | ආනයන ගාස්තු නිදහස්කරණය (VAT[3]/PAL[4]/CID[4]/CESS[4]) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සමාගමේ ආදායම් බදු නිදහස්කරණය | | | අපනයනකරුවන් සඳහා එවකට පවතින සමාගම් ආදායම් බදු අනුපාතයෙන් 50%ක සහනය ලැබෙන කාලය | | | | ඉදිකිරීම් ආශ්‍රිත භාණ්ඩ | | | ප්‍රාග්ධන භාණ්ඩ (පිරියත, යන්ත්‍ර හා උපකරණ)[5] | | | අමුද්‍රව්‍ය සහ නිෂ්පාදනය/ක්‍රියාවලිය ආශ්‍රිත පාරිභෝගික භාණ්ඩ[5] | | |
| | | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය | | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය |
| 1 | ජේ ජේ ටෙක්ස්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 00246395) | දහයයි (10) | 2025 ජූලි මස 25 දින | 2035 ජූලි 24 දින | පහයි (05) | 2035 ජූලි 25 දින | 2040 ජූලි 24 දින | වසර පහක් (05) සඳහා උපරිම විදේශීය ශ්‍රමිකයන් දස (10) දෙනෙක් | අදියර 1 මාස දහ අටක් (18) | 2024 ජූලි 25 | 2026 ජනවාරි 24 | දහයයි (10) | 2024 ජූලි 25 | 2034 ජූලි 24 | දහයයි (10) | 2024 ජූලි 25 | 2034 ජූලි 24 |
| | | | | | | | | | අදියර 2 මාස හතලිස් දෙකක් (42) | 2024 ජූලි 25 | 2028 ජනවාරි 24 | | | | | | |
| | | | | | | | | | අදියර 3 මාස පනස් හතරක් (54) | 2024 ජූලි 25 | 2029 ජනවාරි 24 | | | | | | |

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 අගෝස්තු 23,
කොළඹ දී ය.

[1] සමාගම් ආදායම් බදු නිදහස් කාල සීමාව සහ සහන කාලය අවසන් වීමෙන් අනතුරුව;

i. අපනයන වශයෙන් සලකනු ලබන භාණ්ඩ ද ඇතුළත් ව, අපනයනයන් හරහා ජනනය කරනු ලබන ආදායම් වෙනුවෙන්, එම කාලයෙහි පවතින අපනයනකරුවන් හට බලපාන්නා වූ සමාගම් ආදායම් බදු අනුපාතය අදාළ වනු ඇත.

ii. දේශීය වෙළඳපල වෙත ආනයන ආදේශනයක් ලෙස අලෙවි කිරීම හරහා ජනනය කරනු ලබන ආදයම වෙනුවෙන්, එම කාලය තුළ නිෂ්පාදකයන් වෙත අදාළ වන්නා වූ සමාගම් ආදායම් බදු අනුපාතය අදාළ වනු ඇත.

[2] ආදායම් බදු නිදහස්කරණය ගණනය කිරීමේ දී, කලාපය තුළ පවත්නා ව්‍යවසායයේ විදේශීය සේවා නියුක්තිකයන්, සේවා නියුක්තිය තුළින් ලබන ප්‍රතිලාභ හා ලාභ තුළින් ඉස්මතු වන ආදායම් පමණක්, බද්දෙන් නිදහස් විය යුතු ය.

[3] බන්ධිත ප්‍රදේශවලින් (රේගු දෙපාර්තමේන්තු හෝ BOI) මිලදී ගැනීම් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පාලනය කරනු ලබන එකතු කළ අගය මත බදු පාලන ක්‍රමය (උදා. SVAT) තුළ ලියාපදිංචි වී ඇති ඕනෑම ලියාපදිංචි පුද්ගලයෙකු වෙතින් ලැබෙන සැපයුම් ද ඇතුළත් ව, ව්‍යාපාරය වෙත සිදු කෙරෙන සියලු ආනයන මත.

[4] බන්ධිත ප්‍රදේශවලින් (රේගු දෙපාර්තමේන්තු හෝ BOI) සිදු කරන මිලදී ගැනීම් ද ඇතුළත් සියලු ආනයන මත.

[5] අපනයන වශයෙන් සලකනු ලබන භාණ්ඩ ද ඇතුළත් ව අපනයනය සඳහා නිපදවනු ලබන භාණ්ඩ හා දේශීය වෙළඳපල වෙත ආනයන ආදේශනයක් ලෙස අලෙවි කිරීම සඳහා නිපදවනු ලබන භාණ්ඩ යන දෙඅංශයේම පරිහරණය පිණිස.

EOG 08-0305

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.